**ජල සම්පත් මණ්ඩලය - 2017**

---------------------------------------

ජල සම්පත් මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 42 දරන පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් පනතේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 ජුනි 21 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහියංගනය අධ්‍යාපන කලාපයේ පාසල් 09 ක නල ළිං ඉදිකිරීමේ භූ විද්‍යා සමීක්ෂණ කටයුතු නිම කර තිබුණ ද ඉන් පාසල් 02 කට අදාල රු.82,110 ක මුදල පමණක් ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඉතිරි රු.298,252 ක් වූ මුදල ආදායමට නොගෙන ලැබුණු අත්තිකාරම් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් රු.29,721 ක පාරිතෝෂිත වැඩියෙන් වෙන් කර තිබුණි.

(ඇ) එකම ගනුදෙනුව සඳහා ඉන්වොයිස් පත් දෙකක් නිකුත් කිරීම හේතුවෙන් රු.44,677 කින් ලැබුණු සේවා අත්තිකාරම අඩුවෙන් සහ ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂ වටිනාකම වූ රු.18,849,408 කින් රු.3,178,291 ක් වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ වූ අතර මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.860,800 ක් වූ ණයගැති ශේෂය 2015 දෙසැම්බර් 31 දින සිට අය නොවී පැවතුණි.

(ආ) පුද්ගලයින් සහ ආයතන 214 කින් විවිධ සේවාවන් ඉටු කර දීම සඳහා ලැබුණු රු.82,380,321 ක් වූ සේවා අත්තිකාරම්වලින් රු.2,611,379 ක් වර්ෂයක කාලයක් ඉක්ම වී තිබුණ ද අදාල කාර්යයන් ඉටු කර දීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති රීති සහ රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 14(1) වගන්තිය සහ 1999 අංක 42 දරන සංශෝධිත පනතේ 3 වගන්තිය | සංශෝධිත පනත ප්‍රකාරව 18 දෙනෙකුගෙන් යුක්ත උපදේශක කමිටුවක් පිහිටුවිය යුතු වුවද ඊට පටහැනිව 9 දෙනෙකුගෙන් යුක්ත උපදේශක කමිටුවක් පිහිටුවා තිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සඳහා වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.7 ඡේදය | නිලධාරීන් 27 දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ ඔවුන්ගේ වැටුපට අමතරව රු.1,964,633 ක විශේෂ දීමනාවක් මණ්ඩලය විසින් ගෙවා තිබුණ ද ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,743,000 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,092,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,349,000 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.59,243,000 කින් වැඩි වී තිබුණ ද වර්ෂයේ පරිපාලන වියදම රු.38,057,000 කින් හා අනෙකුත් ව්‍යාපෘති වියදම් රු.28,121,000 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේ දී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් දක්නට ලැබුණ ද 2016 සහ 2017 වර්ෂවලදී අතිරික්තයක් දක්නට ලැබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමෙන් පසු මණ්ඩලයේ දායකත්වය 2013 වර්ෂයේ සිට වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී රු.227,278,000 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 2017 වර්ෂයේ දී ඉටු කළ යුතු සමස්ත කාර්යය ඉටු කර ගැනීමට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඊට අනුරූපීව අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වුව ද එ පරිදි කටයුතු කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම එකිනෙකට සැසදිය හැකි ආකාරයට පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාව මණ්ඩලය පිළියෙල කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකමට අදාල මූල්‍ය කාර්යසාධනය එම වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මඟින් විෂයයන් 08 ක් යටතේ පර්යේෂණ 575 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණ ද ප්‍රගති වාර්තා අනුව මණ්ඩලය විසින් පර්යේෂණ ඒකක 356 ක් පමණක් ඉටු කර තිබුණු අතර ඉටුනොකළ ප්‍රමාණය 219 ක් විය. කාර්යයන් ඉටු නොකළ ප්‍රමාණය සියයට 24 ත් සියයට 100 ත් අතර පරාසයක විය. ඒ සඳහා මණ්ඩලය සතු භූ ජල විද්‍යාඥයින්ගේ හිඟය, රටතුල පැවති හදිසි ආපදා අවස්ථාවලට ඔවුන් යෙදවීමට සිදු වීම, සම්පත් හා තාක්ෂණික කාර්යය මණ්ඩලය සීමාසහිත වීම යන හේතු බලපා තිබුණි.

(ආ) පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු

(i) 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ජලය පිළිබඳ තත්ත්වය සහ එයින් පොදු ජනතාවට වන බලපෑම පරික්ෂා කිරීම සඳහා රු.133,550,000 ක ඇස්තමේන්තු පිරිවැයට පර්යේෂණ අධ්‍යයන 08 ක් ආරම්භ කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට රු.67,159,000 ක් වැය කර තිබුණි. මෙම පර්යේෂණ අධ්‍යයනවලින් 04 ක් 2017 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණ ද එම පර්යේෂණ අධ්‍යයන 04 ම නියමිත පරිදි නිමකිරීමට නොහැකිවීම නිසා පර්යේෂණ අධ්‍යයනවලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ii) පර්යේෂණ අධ්‍යයනයන් සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ කාලීනව පර්යේෂණ නිලධාරියෙකු පත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් සියලුම පර්යේෂණ අධ්‍යයනයන් සඳහා පර්යේෂණ නිලධාරී ලෙස මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී පත් කර තිබුණි. ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලට අමතරව පර්යේෂණ අධ්‍යයන සඳහා යොමුවීමට සිදුවී ඇති බැවින් සැලසුම් කරනලද කාලපරිච්ඡේදය තුළ දී පර්යේෂණ අධ්‍යයනයන් නිම කිරීමට නොහැකිවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට පර්යේෂණ අධ්‍යයනවල ඇස්තමේන්තුගත මුදලින් ලබා කර ගත් මූල්‍ය ප්‍රගතිය සියයට 15 සිට සියයට 65 දක්වා පරාසයක වූ අතර එම ව්‍යාපෘතිවල කාල ප්‍රමාදය වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා විය. තවද පර්යේෂණ අධ්‍යයන දීර්ඝ කිරීමේ දී එයට හේතු සහ ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 ජුනි 29 දින උපදේශක කමිටුව රැස්වී තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයන 08 ක ප්‍රගති වාර්තා උපදේශක කමිටුවේ උපදෙස් සඳහා යොමු කර නොතිබුණි.

(ආ) වෙනත් රාජ්‍ය ආයතනවලට අයත් වාහන 03 ක් 1981, 2009 සහ 2016 යන වර්ෂවල සිට මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණ ද එම වාහන පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයතුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව තොග අයිතම ඒකක 31 ක අතිරික්තයක් හා ඒකක 134 ක ඌනතාවයක් හඳුනාගෙන තිබුණ ද ගිණුම්වල ගැලපීම් සිදු කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------------

අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.171,516,000 ක් වූ තොගය තුළ රු.76,474,390 ක් සෙමින් චලනය වන, නිකුත් නොවන සහ යල්පැනගිය තොග ඇතුළත් විය.

## 4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

---------------------------------------------------------------------------

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, රත්මලාන හා වවුනියා වැඩපල සහ අනුරාධපුර සංචාරක බංගලාව පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි මණ්ඩලය වෙත පවරාගැනීමට කටයුතු කර ගැනීමකින් තොරව

සමාලෝචිත වර්ෂය ආරම්භය වන විට එම ඉඩම්වල රු.6,258,000 ක් වැය කර නව ගොඩනැගිලි ඉදිකිරීම් හා පවතින ගොඩනැගිලි වෙනස් කිරීම් ද මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

### 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයේ කාර්යයභාරය ඉටු කර ගැනීම සඳහා බඳවාගෙන තිබුණු රියදුරකු මණ්ඩලයේ කාර්යයන්ගෙන් බැහැර රේඛීය අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු සඳහා 2017 ජනවාරි 11 දින සිට මුදා හැර තිබුණු අතර රු.145,392 ක වැටුප් හා දීමනා මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජල සම්පත් මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජල සම්පත් මණ්ඩලය දැනුවත් වී තිබුණ ද ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්කය ලඟා විය යුතු සංධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස පරිසර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන පාර්ශවයන් හඳුනාගෙන තිබුණ ද ආයතනයට අදාල ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළගාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ පුහුණු සේවකයන් නොවීම යන කරුණු හේතු වී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන වාර්ෂික සංධිස්ථාන හඳුනාගෙන නොතිබුණි.

(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟාවීමට සැලැසුම් සකස් කිරීමේ සහ පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 6.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයට අභ්‍යන්තර විගණක ඇතුළු සහායක නිලධාරීන් දෙදෙනෙකු හා විදුම් සහකාරවරයෙක් පත් කර තිබුණි. මේ අනුව තාක්ෂණ හා ඉංජිනේරු ශිල්පක්‍රම භාවිතා කරන මණ්ඩලයේ වැඩ කටයුතු විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කිරිමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

### 6.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ප්‍රසම්පාදනය සැලැස්මෙහි ඇතුළත් අයිතමයන් කෙරෙහි අවධානය යොමු කිරීමකින් තොරව සැලැස්මෙහි ඇතුළත් නොවූ අයිතමයන් 06 ක් ප්‍රසම්පාදනය කර තිබුණු අතර 2017 අප්‍රේල් 30 දින වන විට ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂා කරන ලද අයිතමයන් 10 ක් එම දිනයේ දී ප්‍රසම්පාදනය කර නොතිබුණි. ඒ අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.3 අයවැය පාලනය

අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 12 සිට සියයට 138 දක්වා වූ පරාසයක සහ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 1094 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

### 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2016 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

අවුරුදු 06 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.1,308,699 ක ඇප බැඳුම්කරයකට යටත්ව 2005 වර්ෂයේදී ශිෂ්‍යත්වයකට විදේශගත වූ භූවිද්‍යාඥවරියක ශිෂ්‍යත්වයෙන් පසුව ගිවිසුම්ගත සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර වෙනත් ආයතනයකට මුදාහැර තිබුණි. එම මුදාහැරීම සඳහා ද වර්ෂ 04 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.435,600 ක ඇප බැඳුම්කරයකට අත්සන් කර තිබුණි. නිලධාරිණිය බැඳී තිබුණු ගිවිසුම් 02 ට අනුකූලව කටයුතු කර නොතිබිය දී 2011 වර්ෂයේ සිට මණ්ඩලයේ සේවයෙන් ස්ථිරව ම මුදාහැර තිබුණ ද ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.1,744,299 ක ඇප මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

----------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම හා ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | කාර්යසාධනය | අපේක්ෂිත පරිදි මූල්‍ය හා භෞතික කාර්යසාධනය ළඟා කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් | නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඈ) | පර්යේෂණ කටයුතු | සැලසුම්කළ පරිදි පර්යේෂණ අධ්‍යයන නිම කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | වත්කම් පාලනය | වත්කම් ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම. |